© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ජාතික අධ්‍යාපන ආයතනය**
**විභාග දෙපාර්තමේන්තුව**
**தேசிய கல்வி நிறுவகம்**
**பரீட்சைகள் துறை**
**NATIONAL INSTITUTE OF EDUCATION**
**DEPARTMENT OF EXAMINATIONS**

**අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 2022/2025**
**පළමු මට්ටම සෙමෙස්තරය I පරීක්ෂණය - 2024**

| BDE152 | ශ්‍රී ලාංකේය නර්තන අධ්‍යයනය හා ඉගැන්වීම් ක්‍රම<br>Sri Lankan Dance Study and Teaching Methods |
|---|---|

මූලාකෘති ප්‍රශ්න පත්‍රය කාලය : පැය තුනයි

*උපදෙස් :-*

- I කොටසේ ප්‍රශ්න **සියල්ලට** ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- I කොටසේ පිළිතුරු පත්‍රය, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටසේ සෑම පිළිතුරක් ම නව පිටුවකින් අරඹන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.

---

**විභාග අංකය : ……………..………..**

## I කොටස

- ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සපයන්න.

01. තාලය, රිද්මය, ප්‍රස්තාරකරණය යන මූලධර්ම පිළිබඳ අධ්‍යයනයක යෙදීම නර්තන විෂය සංවර්ධනයට මනා පිටිවහලක් වේ.

(i) 'රුංකත ජිංකත තරිකිට තුංදත් තා' මෙම කස්තිරම් පදය භාවිත කළ හැකි තාල රූප **දෙකක්** පෙන්වා දෙන්න.

(1) ………………………………………………………………………………………………………

(2) ………………………………………………………………………………………………………

(ලකුණු 02යි)

(ii) 'රෙගුද ගතතු දොම්' මෙම බෙර පදය ලය **තුනට** ප්‍රස්තාර කරන්න.

සමගුණ : ………………………………………………………………………………………

දෙගුණ : ………………………………………………………………………………………

සිව්ගුණ : ………………………………………………………………………………………

(ලකුණු 03යි)

---

*2 පිටුව බලන්න*

02. සබරගමු නර්තන සම්ප්‍රදායට සුවිශේෂ වූ ශාන්තිකර්ම ප්‍රචලිතව පවතින අතර ඒවා දෙවියන් යකුන් හා ග්‍රහයින් ප්‍රධාන කොට පුද ලබයි.

(i) සබරගමු නර්තන සම්ප්‍රදායේ පුද ලබන ප්‍රධාන දෙවියන් නම් කරන්න.

.......................................................................................................................................

(ලකුණු 01යි)

(ii) සබරගමු නර්තන සම්ප්‍රදායට සුවිශේෂ වූ ශාන්තිකර්ම **දෙකක්** ලියන්න.

(1) .......................................................................................................................................

(2) .......................................................................................................................................

(ලකුණු 02යි)

(iii) ගර්ම සංරක්ෂණය සඳහා සුවිශේෂ වූ ශාන්තිකර්ම **දෙකක්** ලියා දක්වන්න.

(1) .......................................................................................................................................

(2) .......................................................................................................................................

(ලකුණු 02යි)

***සටහන :***

- මෙම ප්‍රශ්න පත්‍රයේ I කොටස ඉහත ආකාරයේ ප්‍රශ්න අටකින් සමන්විත වේ.
- I කොටසෙහි සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 05 බැගින් ප්‍රශ්න අට සඳහා ලකුණු 40ක් හිමි වේ. (ලකුණු 05 × 8 = ලකුණු 40යි)

* *

*3 පිටුව බලන්න*

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 2022/2025
පළමු මට්ටම සෙමෙස්තරය I පරීක්ෂණය - 2024

| | |
|---|---|
| BDE152 | ශ්‍රී ලාංකේය නර්තන අධ්‍යයනය හා ඉගැන්වීම් ක්‍රම<br>Sri Lankan Dance Study and Teaching Methods |

මූලාකෘති ප්‍රශ්න පත්‍රය

## II කොටස

- ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

01. නර්තන ඇදුරෙකු පැවසුවේ පැරණි නර්තන ගුරුගෙදර අධ්‍යාපනයේ දී ශිල්පය මෙන් ම ශාස්ත්‍රය ද ලබා දුන් බව ය.

   (i) පැරණි නර්තන ගුරුගෙදර අධ්‍යාපනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

   (ii) 'ගුරුවරයා නිර්මාණකරුවෙකි. ඉගැන්වීම ඉගැන්විය නොහැකි ය' යන පාඨය ඇසුරෙන් නර්තන ගුරු භූමිකාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

   (iii) ප්‍රායෝගික නර්තන ක්‍රියාකාරකමක් සඳහා භාවිතයට ගත හැකි සුදුසු ඉගෙනුම් ක්‍රම **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

   (iv) ශිෂ්‍ය සාධන මට්ටමට ළඟාවීමට අවශ්‍ය පෙළඹවීමේ කාර්ය සඳහා නර්තන ගුරුවරයා සමතෙකි. මෙම කියමන කරුණු **දෙකක්** ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 04යි)

02. උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායයන් තුනට ම පොදු වූ වන්නම්වල නර්තනය හා ගායනය යන කොටස් දෙක ම අන්තර්ගත වන අතර ඒ ඒ සම්ප්‍රදායට අනන්‍ය වූ ලක්ෂණවලින් ද යුක්ත ය.

   (i) උඩරට වන්නම් හි තානම ගායනය හා කවි ගායනය, නර්තනයේ දී සහ-සම්බන්ධය පවත්වන ආකාරය සාධාරණීකරණය කිරීමට කරුණු **දෙකක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 02යි)

   (ii) සබරගමු වන්නම් සියල්ල ම නාමිකව සඳහන් කර, කදම්භපක්ෂි වන්නම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 05යි)

   (iii) පහතරට සින්දු වන්නමේ ආරම්භය හා වර්තමානයේ එම වන්නම ප්‍රවර්ධනයට හේතු සාධක පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

4 පිටුව බලන්න

*සටහන :*

- මෙම පත්‍රයේ II කොටස ඉහත ආකාරයේ ප්‍රශ්න හයකින් සමන්විත වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු 15 බැගින් හිමි වේ.
- II කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ප්‍රශ්න හතරක් සඳහා ලකුණු 60ක් හිමි වේ.
  (ලකුණු 15 × 4 = ලකුණු 60යි)

* * *